# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 478/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 18/03/2024 පැය 1030

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.03.17 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 63 | - | - |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය රත්ගම කඳවුර.**

2024.03.17 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා රත්ගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ගෝනපීනුවල පොලිස් වසමේ පිංවත්ත ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 09 මිලි ග්‍රෑම් 810 ක්** සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන රත්ගම පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 24 ක් වූ දොඩන්දූව ප්‍රදේශයේ** පදිංචිකරුවෙකි.

රත්ගම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03.** **අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය මහනුවර කඳවුර.**

2024.03.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මහනුවර කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මහනුවර පොලිස් තබෝදාරාම පාර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලි ග්‍රෑම් 140 ක්** සමඟ සැකකරුවකු අත්අඩංගුවට ගෙන තෙල්දෙණිය පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වූ උඩගම්මැද්ද ප්‍රදේශයේ** පදිංචිකරුවෙකි.

තෙල්දෙණිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04.** **පුරාවස්තු සෙවීමේ අරමුණින් කැණීම් සිදු කල සැකකරුවන් හයදෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ශාස්ත්‍රවෙල කඳවුර.**

2024.03.17 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ශාස්ත්‍රවෙල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත පානම පොලිස් වසමේ රදැල්ල කුඹුක්ගේ රක්ෂිත ප්‍රදේශයේ වැටලීම් සිදු කර අනවසරයෙන් නිධන් සෙවීමේ අරමුණින් කැනීම් සිදුකල සැකකරුවන් හය දෙනෙකු අත්අඩංගුවට ගෙන පානම පොලිස් ස්ථානයට භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 27 ත් 50 ත් අතර වයස් වල පසු වන වැල්ලව, පොතුවිල්, නිට්ටඹුව, බිබිල, කුරුණෑගල හා පානම ප්‍රදේශ** වල පදිංචිකරුවන් වේ. පානම පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**